## ‘සංහාරයේ දෝංකාරය 1818 - 2018’

යනු යුරෝපීය දේශපාලනික න්‍යාය පත්‍ර උදෙසා ක්‍රියාත්මක වූ යටත් විජිතවාදී මෙහෙයුම් අතරතුර අතිශය කෲර ලෙස මරා දැමූ දහස් සංඛ්‍යාත සිංහලයින්ගේ විලාපයේ අනවරත දෝංකාරයයි. ව්‍යවහාර වර්ෂ 1505 සිට 1948 ප්‍රත්‍යාත් යටත් විජිත තත්ත්වය ලබාදෙන තුරු පෘතුගීසි, ලන්දේසි හා අවසාන වශයෙන් ඉංග්‍රීසි යනුවෙන් කෲරත්වයේ අවධි හා ස්වරූප ත්‍රිත්වයක් ස්වදේශික බහුතර සිංහලයන්ද, දෙමළ හා මුස්ලිම් ජනතාවද අත්වින්දාහ. ඒ කෲරත්වයේ උච්චතම අවස්ථාව ලෙස ඉතිහාස ගත වන්නේ 1817-1818 වකවානුවේ ඌව වෙල්ලස්ස හා සමස්ත උඩරටම ආශ්‍රිතව සිදුවූ මහා මිනිස් සංහාරයයි. එය ධවල චර්මධාරී යටත් විජිත සැහැසිකම් වල කූටප්‍රාප්තියයැයි කීම අතිශයෝක්තියක් නොවේ.

ව්‍යවහාර වර්ෂ 1815දී උඩරට සිංහල ප්‍රභූන් හා බ්‍රිතාන්‍ය ගෝරමේන්තුව අත්සන් කරන්නට යෙදුනු ‘උඩරට ගිවිසුමේ’ එකඟතා ම්ලේච්ඡ ලෙස යටත් විජිත පාලකයින් උල්ලංඝණය කරනු දුටු සිංහලයින් ඊට එරෙහි වන්නට යෙදුනේ 1816 සිටමය. ඒ සියල්ලට එරෙහිව දරුණු ලෙස ආරම්භ කළා වූ මර්දනය, වරෙක ඉතා කුමන්ත්‍රණකාරී ලෙසද, තවත් වරෙක ඉතා සහාසික ලෙසද ක්‍රියාත්මක විය. ගෝරමේන්තුවට එරෙහිව නැගී ආ මහජන හා සන්නද්ධ අරගලය නිමා කරන්නට ආණ්ඩුකාර රොබට් බ්‍රවුන්රිග් කුඩා දරුවන්, කාන්තාවන්, ඇතුළු සියල්ලන් සමූල ඝාතනය කරමින්, ගේ දොර, කෙත්වතු, ධාන්‍ය ගබඩා, වතුපිටි, හරකබාන, වැව් අමුණු විනාශ කිරීමේ ‘බිම්පාලු’ ක්‍රමවේදය අනුගමනය කරන්නට අණ දෙන්නේය.



සියලු විමුක්තිකාමීන්ගේද නිරායුධ අහිංසක මිනිසුන්ගේද උණු ලේ ගංගා ගලා යද්දී, අඩුම තරමින් සිංහලයින් 10,000ක් මරා දමන්නට ඇතැයිද, වෙල්ලස්සට තවත් අවුරුදු 300කට නැගිටින්න බැරියැයිද, බ්‍රවුන්රිග් සිය වංශාධිපතිවරයාට ලියා යැව්වේය.

ඒ ගලාගිය උණු ලේ සුවඳ තවමත් දැනේ. ඒ විලාපයන් තවමත් ඇසේ. ලොව පුරා කතා බහට ලක්ව ඇති මහා මිනිස් ඝාතන අතුරින් එකක් වූ 1818 සංහාරය අප ස්මරණය කළ යුත්තේ නූතන පෘතුගාලය හෝ ඕලන්දය හෝ එංගලන්තය සමග වෛරී සිතුවිලි ජනනයට නොව, ඓතිහාසික වශයෙන් අපට සිදුවූ දැවැන්ත අසාධාරණය සිහිපත් කිරීමටය; ඒ අඳුරු යුගයන්හිදී, යටත් විජිතවාදීන් විසින් සිංහලයන් සංහාරයට සුළුතර දෙමළ හා මුස්ලිම් ජාතිකයින් පමණක් නොව වරදානයන්ට ගිජු සිංහලයන් පවා යොදාගත් බව මෙනෙහි කිරීමටය; යටත් විජිත පාලනයේ අවසන් වකාවානුවේ උපක්‍රමශීලීව ක්‍රියාත්මක කළා වූ දේශපාලන උපාය තවමත් කරපින්නා ගෙන සිටින අපි එකිනෙකා සමග කා කොටා ගන්නා බව ඒත්තු ගැන්වීමටය.!

එළඹෙන 2018 වසරේදී 1818 මිනිස් සංහාරයට දෙසියය වසරක් සපිරෙන්නේය. එහෙත් සිංහල රටේ ස්වදේශිකයන්ට එරෙහිව අඛණ්ඩව ක්‍රියාත්මක සංහාරය පෙනෙන්නට තිබේ. එහෙයින් සංහාරයේ දෝංකාරය යනු එක් අතකින් අනවරත සංහාරයත්, අපරාධකරුවනුත් හෙළිදරව් කොට යුක්තිය ඉල්ලීමෙ ඝෝෂයක්ද වන්නේමය.

ඒ සංහාරයේ මනඃකල්පිත හෝ හුදු මතකයන් පමණක් ආවර්ජණය කරනු වෙනුවට, ශාස්ත්‍රීයව පිළිගැනුන මූලාශ්‍රයන් හා ජනශ්‍රැති මූලික මූලාශ්‍රද හදාරා 1505න් ඇරඹී අඳුරු යුගයේදී බහුතර සිංහලයන්ද, ස්වදේශික දෙමළ හා මුස්ලිම් ජාතිකයන්ද අත්විඳි අති අමානුෂික අයුක්ති සහගත අත්දැකීම් 20ක් විශාල කැන්වස් පුවරු මත සිත්තම් වී තිබේ. දේශප්‍රේමීන් හා ආයතන ගණනාවක අනුසරණින් පැවැත්වෙන ‘සංහාරයේ දෝංකාරය’ (Resonance of the Massacre 1818-2018) මේ අපූරු සිත්තම් පෙළහර කොළඹ, තුම්මුල්ල ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මන්දිරයේදී 2017 නොවැම්බර් 25, 26 හා 27 යන තෙදින තුළ පැවැත්වීමට ‘සිංහල සංගේදම’ කටයුතු කරයි. කොළඹ ප්‍රදර්ශනයෙන් අනතුරුව දිවයිනේ වෙනත් ප්‍රදේශ වලද ‘සංහාරයේ දෝංකාරය’ සැරිසරනු ඇත.

## ‘Resonance of the Massacre 1818-2018’

is the reverberation of the cries of thousands of majority Sinhalese, native Tamils and Muslims who were assassinated brutally during colonial rule. Until the so-called ‘independence’ was granted, the natives were suffocated by the political, economical and cultural injustices of Portuguese, Dutch and finally the British since 1505. Climax of this brutality was the “Rebellion of Uva Wellassa”, and the genocide in the Kandyan Kingdom during the period of 1817-1818.

Native Sinhalese began uprising against the British since 1816, after the colonial rulers started to breach the conditions of the Kandyan Convention, which was signed between the British and the chiefs of the Kandyan Kingdom.

The British began the dreadful suppression against the Sinhalese considering them as “rebels”. The governor Robert Brownrigg declared the Scorched Earth Policy “bimpalu” strategy, to kill all the civilians, including children women and even the cattle and destroy the properties, paddy fields, irrigation reservoirs, to tame the uprising.



Brownrigg proudly reported how he quelled the Sinhala liberators and civilians, and according to this report the British mercilessly killed at least 10,000 people including